**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව - 2023**

------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනජය සිටි ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2023 වර්ෂයේ කොන්ත්‍රාත් සමාගමට ගෙවන ලද රු.53,616,974 ක් සහ උපදේශන ආයතනයට ගෙවන ලද රු.1,813,500 ක මුදල පාලම් හා බෝක්කු යටතේ දක්වා තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | අදාල වත්කම් නිවැරදි වත්කම් ගිණුම යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජනජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදුවීම නිසා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම් අසම්භාව්‍ය වගකීමක් ලෙස දක්වා තිබුණද බිල්පත් ගෙවීම් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවිය යුතුව පැවති රු.66,858,731 ක් අසම්භාව්‍ය වගකීමක් ලෙස දක්වා නොතිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශනයේ 10වැනි පිටුවේ 07 කරුණ යටතේ අසම්භාව්‍ය බැරකම් ලෙස දක්වා ඇති බව. | ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.512,834,813ක ස්ථාවර වත්කම් වටිනාකමට අදාළව ක්ෂය කිරීම් සිදුකර නොතිබු අතර 2020 වර්ෂයෙන් පසුව මිලදී ගන්නා වත්කම් සඳහා පමණක් ක්ෂය ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේදී රු.1,417,377ක් අඩුවෙන් හා රු.2,589,429 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයෙන් පසුව මිලදී ගන්නා ලද වත්කම්වල 2023 වසරට අදාලව ගණන් කරන ලද ක්ෂය වෙන්කිරීම් වටිනාකම් නැවත වෙන්කර විගණන අංශයේ තොරතුරු සමඟ සැසඳීම් කර නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් රු.2,200,110ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග ලෙස ලැබි තිබු පුස්තකාල පොත් වටිනාකම රු.290,686 ක් ගිණුම්ගතකර නොතිබුණි. | මෙය ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,481,525 ක් වූ ණයහිමියන්, විවිධ ණයහිමි හා ගබඩා ණයහිමි ගිණුම් දෙකෙහිම ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් යොදා නිවැරදි කිරීමට සටහන් කර ඇති බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂය තුල පුරවැසි ප්‍රඥප්ති දැන්වීම් පුවරුව සඳහා දැරූ රු.400,000 සහ ඉනිමං මිලදී ගැනීම සඳහා දැරූ රු.575,000 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.4,275,417 වටිනා බඳුන් හා උපකරණ එම ගිණුම යටතේ ගිණුම්ගත නොකර පාරවල් හා බෝක්කු ගිණුමට හර කර තිබුණි. | ජ'නල් මගින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | -එම- |
| (එ) | අයිතමයන් 6ක වටිනාකම වන රු.674,520 ක් සවිකිරීම් ගිණුමට හර කරනු වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | -එම- |
| (ඒ) | සේවක රථ පාලිකා හා දේපළ තහනම් නිලධාරි ඇප තැන්පත් ඉතුරුම් ගිණුම් වල 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.692,054 ක් වුවත්, රු.716,228 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කර ඇති බව. | -එම- |
| (ඔ) | තොග විශ්ලේෂණයට අනුව රු.204,491ක් වූ පුනරාවර්තන වියදම් හා රු.3,488,954 ක් වූ ස්ථාවර වත්කම් අදාළ ගිණුම් වලට හර කරනු වෙනුවට තොග ගිණුමට හර කර තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍රා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 03ක ලෙජර් ගිණුම් සහ උපලේඛන අතර රු. 675,157ක වෙනස්කම් පැවතුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | හඳුනාගත නොහැකි සේවක ණය | 1,641,884 | උපලේඛන | වසර 20කට වඩා පැරණි ශේෂයන් වන අතර මෙම ශේෂයන් හඳුනාගෙන සුදුසු පියවර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති බව. | උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අගරු වූ චෙක්පත් | 581,650 | උපලේඛන | ජ’නල් සටහන් මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | -එම- |
| (ඇ) | තොගය | 39,845,468 | උපලේඛන | අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 හා 104(3)(4) | සභාවේ වාහන 10 කට අදාලව සමාලෝචිත වර්ෂය තුල සිදුවී තිබූ අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සිදු වන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 104 අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි II වැනි කොටස ප්‍රචාරක දැන්වීම්හි (1) ඡේදය | කිසියම් තැනැත්තකු විසින් යම් විදියකට, පාරකට, ඇළකට හෝ වැවකට පෙනෙන සේ කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ සිදු කළයුතු වුවත් සභා බල ප්‍රදේශය තුල පිහිටුවා තිබූ එවැනි දැන්වීම් පුවරු 87ක් වෙනුවෙන් මුදල් ගෙවා නොතිබුණු අතර ඒවා ගලවා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ගාස්තු නොගෙවා ඇති පුවරු ගලවා ඉවත් කිරීම අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සිදු කරමින් පවතන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | නගර සභාවට අයත් වාහන 7 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරික්ෂාව සිදු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති මෙම වාහන 07හි ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.210,290,184 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.305,213,090 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | 2023 දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | 2022 දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු000. | රු000. | රු.000 |
| (i) වරිපනම් හා බදු | 283,200 | 268,546 | 279,125 | 197,088 | 284,500 | 256,056 | 207,781 | 173,684 |
| (ii) කුලී | 100,073 | 72,890 | 72,339 | 45,619 | 74,181 | 75,250 | 77,390 | 31,776 |
| (iii) බලපත්‍ර ගාස්තු | 38,476 | 42,215 | 42,215 | 0 | 20,500 | 27,555 | 27,570 | - |
| (iv)වෙනත් ආදායම් | 1,344,534 | 629,122 | 632,330 | 4,192 | 144 | 106 | 115 | 3 |
| එකතුව | 1,766,283 | 1,012,773 | 1,026,009 | 246,899 | 379,325 | 358,967 | 312,856 | 205,463 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අය නොවී පවතින වරිපනම් ශේෂය රු.141,865,710ක් විය. | වරිපනම් බදු ශේෂය 2023.12.31 දිනට රු. 173,248,927හිඟයෙන් මේ වන විට රු.31,383,217ක මුදලක් අයකර ගෙන ඇති බව. | අයකර ගත යුතු බදු වටිනාකම් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩ කුලී | | |
| | (i) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු කඩකුලී ආදායම රු. 35,090,412 ක් වූ අතර වර්ෂයක | හිඟ කඩකුලී අයකර ගැනීමට මේ දිනවල කටයුතු සිදු කරමින් පවතින බව. | අයකර ගත යුතු කඩ කුලී ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලය ඉක්මවා තිබූ හිඟ කුලී වටිනාකම රු.30,130,251 ක් විය. | | |
| (ii) | වැලිකඩ ප්ලාසා පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10ක් ටෙන්ඩර් කර කුලියට ලබා දී නොතිබුණු අතර අනෙකුත් කඩ කාමර 1998 වර්ෂයේ සිට ව්‍යාපාර කටයුතු සඳහා කඩ හිමියන් වෙත ලබා දී තිබුණි. 2013 දක්වාම කඩ කාමර කුලී සභාවේ ආදායම් පරීක්ෂකවරුන් විසින් තක්සේරු කර ඒ මත කුලී අයකර තිබූ අතර 2023 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නව තක්සේරුවක් කඩ වෙනුවෙන් ලබා ගෙන තිබුණ ද කඩ හිමියන්ගේ විරෝධතාවය නිසා තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම කඩ කාමර 10 ටෙන්ඩර් කර කුලියට දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. කඩ හිමියන්ගේ විරෝධතාවය සම්බන්ධව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ උපදෙස් මත නැවත වැලිකඩ ප්ලාසා වෙළඳ සංකීර්ණයේ කඩ තක්සේරුව සඳහා යොමු කර ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුවේ නව කඩ තක්සේරුව ලැබුණු පසුව අදාල හිඟ මුදල සමඟ කඩකුලී අය කිරීමට කටයුතු කරන බව. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ මුද්දර ගාස්තු රු.500,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අයවිය යුතු මුද්දර ගාස්තුව රු.152,347,461ක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට උසාවි දඩ රු.3,891,500 ක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය වර්ෂ 5ක සිට වර්ෂ 10ක් දක්වා කාලයට අදාළ රු.879,787 කින් සහ වර්ෂ 10 ට වැඩි කාලයක සිට අයවිය යුතු රු.3,011,713කින් සමන්විත විය. | මේ වන විට පෙර වර්ෂවල බිල්කළ ආදායමේ හිඟ ආදායම් එකතුකර ගෙන ඇති අතර තවදුරටත් හිඟ ආදායම් හඳුනාගැනීම හා එකතු කර ගැනීම සඳහා සභාවේ නිලධාරීන් හා සේවකයන් යොදවා ඇති බව.<br>උසාවි දඩ<br>2013 වර්ෂයේ සිට අයකර ගත යුතු මුදල් පිළිබඳව තවදුරටත් සොයා බලා අයකර ගැනීමට අපේක්ෂා කරන බව. | හිඟ ආදායම හඳුනාගෙන හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ පිහිටි සිනමා ශාලා දෙකකින් 2019 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති විනෝද බදු ශේෂය රු.2,781,679 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිටද අයකරගෙන නොතිබුණි. | විනෝද බදු සම්බන්ධ ලිපියක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති අතර ඒ සඳහා විගණිත දිනය තෙක් අනුමැතිය ලැබී නොමැති බව. | අයවිය යුතු ආදායම හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රචාරක දැන්වීම් සහා බල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට කොමසාරිස්වරයාගේ අවසරය අවශ්‍ය වන අතර අදාල ගාස්තුව ගෙවන තෙක් ඒ සඳහා වන බලපත්‍රය ඉල්ලුම්කරුට නිකුත් නොකළ යුතුය. කෙසේ වෙතත් 2023 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු, වෙළඳ නාම පුවරු හා නාම පුවරු අයදුම්පත් අතරින් රු.127,100ක වටිනාකමැති අයදුම්පත් 03ක් ගාස්තු ගෙවා නොතිබූ අතර එම අයදුම්පත්වලට අදාල දැන්වීම් පුවරු සහා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ බව භෞතික පරීක්ෂාව අනුව නිරීක්ෂණය විය. මෙතෙක් එම ගාස්තු අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ආයතන 08 සඳහා ගාස්තු ක්‍රියාත්මක කර ඇත්තේ දැන්වීම් නාම පුවරු සමීක්ෂණයේදී හඳුනාගත් නම් කරන ලද ස්ථාන සඳහා වේ. භෞතිකව 2023 වර්ෂයේ ප්‍රදර්ශනය කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගාස්තු නියම කර ඇති බව. | ගාස්තු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගාස්තු ගෙවා නොමැති පුවරු ගලවා ඉවත් කිරීම සඳහා ප්‍රධාන නාගරික ඉංජිනේරුගේ ප්‍රධානත්වයෙන් එම දෙපාර්තමේන්තුවට පවරා ඇති නමුත් 2016 සිට 2023 දක්වා ගාස්තු ගෙවා නොමැති රු.70,245,648 ක වටිනාකමැති නාම පුවරු 435ක් හා රු.28,224,248ක වටිනාකමැති දැන්වීම් පුවරු 118ක් සඳහා 2023 ඔක්තෝබර් වන විටත් හිඟ මුදල් ලැබී නොමැති අතර පුවරු ගලවා ඉවත් කිරීමද සිදුකර නොතිබුණි. හිඟ මුදල් ලැබිය යුතු මුදල් ලෙස ඉදිරියට ගෙන යාමක් සිදුකර නොතිබුණි. | රට තුල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් හා ඉන් පසු ඇති වූ අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් ලද ඉල්ලීම අනුව මෙම කාර්යය තාවකාලිකව නතර වී තිබූ අතර මේ වන විට ගාස්තු නොගෙවා ඇති පුවරු ගලවා ඉවත් කිරීම අඛණ්ඩව සිදු කරමින් පවතින බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොරෝනා පැවති කාලයේදි ලබා දී ඇති කොරෝනා අත්තිකාරම් උපලේඛන අනුව අයවිය යුතු ශේෂයන් ලෙස පවතින රු.960,160 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවී නොතිබුණි. | ගිණුම් පොත් වල පෙන්නුම් නොකරන ශේෂයන් නැවත පොත්වල සටහන් කරගෙන ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | ගිණුම් පොත් වල පෙන්නුම් නොකරන ශේෂයන් පිළිබඳ සොයා බලා නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොවිඩ් පළමු රැල්ල අවස්ථාවේ සභාව මගින් සිදු කර තිබුණ සහන පදනම මත භාණ්ඩ අලෙවි කිරීමේ හා බෙදා හැරීමේ වැඩසටහන යටතේ සභාවෙන් විකිණීම සඳහා භාණ්ඩ රැගෙන ගොස් ඇතත් එයින් ලද මුදල් සභා අරමුදලට බැර නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කොරෝනා | මේ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් පරීක්ෂණ සිදු කරමින් පවතින අතර එහි ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව. | පරීක්ෂණ අවසන් වූ වහාම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් ශේෂය රු.1,291,160ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කෝට්ටේ බල ප්‍රදේශයේ ජනතාව විසින් ජල සැපයුම ලබා ගැනීමේදී සිදු වන මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් සභාව විසින් මහජනතාවගෙන් 2023 වර්ෂයේ ඔක්තෝබර් දක්වා රු.1,490,252ක මුදලක් ලබාගෙන ඇතත් නැවත ඒවා පිළිසකර කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති මාර්ග පළුදු කිරීම් නිසි පරිදි පිළිසකර කර ඇති බව. | පළුදු කළ මාර්ග යථා තත්ත්වයට පත්කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඈ) | ජනපය සිටි වෙළඳ සංකීර්ණය සෑදීම වෙනුවෙන් 2014 සිට බිල්පත් වටිනාකම් අඩුවෙන් ගෙවීම නිසා රු.31,120,027 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි. තවද මෙම වටිනාකම් සැදුම්ලත් ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සභාව විසින් රු. 31,120,027 ප්‍රමාද ගාස්තුවක් ගෙවීම සිදු කර ඇත්තේ 2014 සිට බිල්පත් වටිනාකමින් අඩු වටිනාකමක් ගෙවීම හේතුවෙන් ඉතිරි මුදල් ශේෂ සඳහා ගිවිසුම් ප්‍රකාරව ඇති හිඟ ශේෂ සඳහා පොලී ගෙවීමට සිදු වීම හේතුවෙන් බව. | ප්‍රමාදයකින් තොරව බිල්පත් පියවීම තුලින් සභාවට දැරීමට සිදුවන මෙවැනි විශාල මූල්‍යමය පාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැලිකඩ ප්ලාසා වෙළඳ සංකීර්ණය සඳහා 2023 වර්ෂය වෙනුවෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද මාසික කඩ කුලී වාර්තාව අනුව එක් එක් කඩ වලට අදාල නව කඩකුලී අගය දන්වා යවන ලදී. කඩ හිමියන් දක්වා ඇත්තේ ඔවුන් කඩය නැවත බදු දී ලබන ආදායම අඩු වන නිසා නව කඩකුලී තක්සේරුවට එකඟ විය නොහැකි බවය. කෙසේ වෙතත් මෙම කඩ හිමිකරුවන් මාසිකව රු.21,000 ක් වැනි අනවසර ආදායමක් උපයාගනු ලබන බවත් බදු ගිවිසුමේ 18 වන කොන්දේසිය උල්ලංඝනය වී ඇති බවත් නිරීක්ෂණය වූ අතර එම ගිවිසුම උල්ලංඝනය කිරීමට එරෙහිව සභාව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාවේ ආදායම් පරීක්ෂක මහතුන් විසින් මේ වන විට වැලිකඩ ප්ලාසා කඩ හිමියන් අතුරු බදු දී ඇත් ද යන්න සමීක්ෂණයක් සිදු කරමින් පවතින අතර ඉන් අනතුරුව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කටයුතු කළ යුතුය. |

## 3.4 නිශ්කාර්‍ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුගේගොඩ බස් නැවතුම්පොළ සංකීර්ණයේ පවතින කඩ කාමර 48ක් අතරින් 43ක්ම 2023 නොවැම්බර් වන විටත් බදු දීමකින් තොරව වසා දමා පැවතුණි. මේ හේතුවෙන් සභාවට මාසිකව අහිමිවන ආදායම රු.42,958 ක් විය. | නාගරික සංවර්ධන අධිකාරිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් නැවත පටන් ගන්නා තුරු අදාල වෙළඳ සංකීර්ණය නැවත බදු දීමට හැකියාවක් පවතීද යන්න නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නැවත විමසා ඇති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ජනජය සිටි වෙළඳ සංකීර්ණය ඉදිරිපිට රථ නැවතුම් ස්ථානය, නගර සභාව ඉදිරිපිට රථ නැවතුම් ස්ථානය, රාජගිරිය ගාඩින්ස්, බුත්ගමුව පාර, වැපල් පාර යන රථ නැවතුම් ස්ථාන ආදායම් රැස්කර ගත හැකි ස්ථාන ලෙස සංවර්ධනය කර නොතිබුණි. | ඉදිරියේදී එම රථ නැවතුම් ස්ථාන හා නව රථ නැවතුම් ස්ථාන හඳුනාගෙන ඉදිරියේදී බදු දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් වාහන 4ක් ගරාජ් වෙත භාරදී මාස 3 ක සිට මාස 6 ක් දක්වා කල් ගතවී තිබුණද විගණිත දින වන විටත් අදාල අළුත්වැඩියාවන් නිමකර වාහන නැවත භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉහත අළුත්වැඩියා කරමින් පවතින වාහන ඉතා ඉක්මනින් අළුත්වැඩියා කර ධාවනයට යොමු කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අළුත්වැඩියාවන් සිදුකර නැවත භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ධාවන තත්ත්වයෙන් ඉවත්කර අපහරණය කිරීමට හඳුනාගෙන තිබුණු වටිනාකම රු.26,422,000 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරණ 5 ක් 2023 වර්ෂය අවසන් වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හඳුනාගෙන ඇති වාහන දෙකක් අධ්‍යයන කටයුතු සඳහා පාසලක් වෙත පරිත්‍යාග කිරීමට කටයුතු කරමින් පවතින අතර අපහරණය කරන අබලි වාහන අපහරණය කිරීමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ගබඩා භාණ්ඩ තොගයේ වටිනාකම රු.158,216,652ක් හා ගොඩනැඟිලි වටිනාකම රු.127,416,735 ක් වුවද ගබඩා භාණ්ඩ හා ගොඩනැගිලි සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | මේ වන විට රක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර කඩිනමින් අවශ්‍ය පියවර ගෙන රක්ෂණ කිරීමට නියමිතව ඇති බව. | වත්කම් වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් භුක්ති විඳින ඉඩම් 13 ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ඉඩම් සඳහා මෙන්ම ප්‍රකාශන ඔප්පු සහිත සියලුම ඉඩම්වලට පැවරුම් නියෝග ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් (බ.ප) වෙත 2023.10.24 දිනැති ඉල්ලුම්පත්‍ර Law/2008/21-4 යටතේ යොමු කර ඇති බව. | නිත්‍යානුකූල අයිතිය සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ,තෘතිය , ද්විතියික සහ ප්‍රාථමික තනතුරු මට්ටම් වල | සභාව තුල පවතින සේවක පුරප්පාඩු වාර්තා සභාව විසින් සෑම මාසයක් පාසා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇති අතර ප්‍රාථමික තනතුරු සඳහා | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන් 199ක පුරප්පාඩුවක් 2023 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | සේවකයින් සේවයට බඳවා ගැනීම් මේ වන විට රජය මගින් නතර කර ඇති බැවින් සේවක පුරප්පාඩු පිරවීම අපහසු කාර්යයක් වී ඇති බව. | |
| (ආ) | වර්ෂ 5ක සිට වර්ෂ 10ක් අතර කාලයක සිට අය නොවී පවතින රු.8,842,794 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් තවදුරටත් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2021 නොවැම්බර් 10 දිනැති චක්‍රලේඛ LGD/02/2021 ට අනුව 2023 මුදල් වර්ෂය සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 මාර්තු 11 දිනදීය. | 2024 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 245ක් සඳහා සලසා තිබූ එකතුව රු.144,809,020 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | අපේක්ෂා කළ පරිදි අදාල වැය විෂයන්ට අදාල වවුචර්පත් ඉදිරිපත් නොවීම නිසා සහ අරමුදල් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම නිසා මෙම මුදල් ඉතිරි වී ඇති බව. | අවශ්‍යතාවය හඳුනාගෙන එය පදනම් කරගෙන අයවැය පිළියෙල කිරීම කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් 59ක් වෙනුවෙන් රු.89,722,800 ක් වෙන්කර තිබුණද එයින් සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කර නොතිබූ අතර එම ප්‍රමාණය රු.70,251,437 ක් විය. | -එම- | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |